# තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය

# ජාතික යෞවුන් සේනාංකය

# ඇබෑර්තු

ජාතික යෞවුන් සේනාංකයේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

**01. සහකාර අධ්‍යක්ෂ (පුහුණු) (MM 1-1)**

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට දායකත්වය හිමිය.

**02. සහකාර අධ්‍යක්ෂ (පළාත්) (MM 1-1 Fixed) – (බස්නාහිර පළාත සහ සබරගමුව පළාත)**

මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ.

**මෙම තනතුරු සඳහා අයදුම් කරනු ලබන සෑම අයදුම්කරුවෙකුම,**

අ. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ආ. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

ඇ. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**01. සහකාර අධ්‍යක්ෂ (පුහුණු) (MM 1-1) - මූලස්ථානය සඳහා**

අධ්‍යාපන සුදුසුකම් :- **බාහිර අයදුම්කරුවන්**

1. ව්‍යාපාර පරිපාලනවේදී (විශේෂ), ව්‍යාපාර පරිපාලනවේදී මානව සම්පත් කළමනාකරණය, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය) විශේෂ, වාණිජවේදී (විශේෂ), විද්‍යාවේදී මානව සම්පත් කළමනාකරණය (විශේෂ), ව්‍යාපාර කළමනාකරණවේදී (මානව සම්පත්) විශේෂ, ව්‍යාපාර පරිපාලනවේදී (මානව සම්පත් කළමනාකරණ) විශේෂ, විද්‍යාවේදී (ව්‍යාපාර කළමනාකරණය) විශේෂ, නීතිවේදී, ශ්‍රම අධ්‍යාපනවේදී, විද්‍යාවේදී කළමනාකරණ (රාජ්‍ය), වාණිජවේදී (සාමාන්‍ය), ශාස්ත්‍රවේදී (ගෞරව) යන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

**සහ**

උපාධිය ලබා ගැනීමෙන් පසු පුහුණු විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දෙක (02) ක පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත සුදුසුකම් 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. කනිෂ්ඨ කළමනාකාර සේවා ගණයෙහි අදාළ විෂය ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස :- අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

වැටුප් ක්‍රමය :- MM 1-1- රු.(53,175 - 10X1,375 - 15X1,910 = 95,575) මීට අමතරව රජයේ අනෙකුත් අනුමත දීමනා ගෙවනු ලැබේ.

**කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා තනතුරු**

**02. සහකාර අධ්‍යක්ෂ (පළාත්) - බස්නාහිර පළාත සහ සබරගමු පළාත සඳහා**

පත්වීමේ ස්වභාවය :-

මෙම තනතුර සඳහා හුදෙක්ම අවුරුදු 03 ක උපරිම කාලයකට යටත්ව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබේ. ස්ථිර පදනමින් බඳවා නොගැණෙන අතර, සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවාදායකයින්ගේ භාරකාර අරමුදලට දායකත්වය තනතුර දරන්නන්ට හිමි වේ.

**සුදුසුකම් :-**

1. සාමාන්‍ය උපාධිය සමග ශ්‍රී ලංකා යුධ හමුදාවේ මේජර් නිලයකට හෝ ගුවන් / නාවික හමුදාවේ ඊට නොඅඩු නිලයක අවම අවුරුදු 03 ක සේවා කාලයක් සපුරා තිබීම.

**හෝ**

2. ශ්‍රී ලංකා යුධ හමුදාවේ ලුතිනන් කර්නල් තනතුරට හෝ එම තනතුරට නොඅඩු නාවික / ගුවන් හමුදාවේ නිලයක වසර 05ක සේවා කාලයක් සපුරා තිබීම.

**හෝ**

3. දීප ව්‍යාප්ත සේවාවක බඳවා ගැනීම් ශ්‍රේණියේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වයස :- බඳවා ගන්නා දිනට වයස අවුරුදු 50 නොඉක්ම විය යුතුය. සේවා මුක්ත භටයකු සඳහා වයස සැලකීමේදී ආයතන සංග්‍රහයේ 17.1 (අ) හි සඳහන් පරිදි ක්‍රියා කරනු ලැබේ.

වැටුප් ක්‍රමය :- රුපියල් 53,175/- ක මාසික ස්ථාවර පරිශ්‍රමිකයක් තනතුරට හිමිවේ. එමෙන්ම ඔබ විශ්‍රාමිකයකු නම් ඔබට හිමිවන්නේ ජීවන වියදම් දීමනාවෙන් අර්ධයක් පමණි.

තනතුරට පැවරෙන කාර්යයන් :-

පළාතේ සියලුම මධ්‍යස්ථානවල මධ්‍යස්ථානාධිපතිවරුන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයේද, පුහුණු වන්නන්ගේද අධීක්ෂණය, කාර්ය මණ්ඩලයේ සහ පුහුණු වන්නන්ගේ විනය හා සුභ සාධන කටයුතු, පුහුණු වන්නන්ගේ බඳවා ගැනීම්, සමාප්ති උත්සව සංවිධානය කිරීම, පළාත තුළ විවිධ වැඩසටහන් සංවිධානය කිරීම, පළාතේ සියලුම මධ්‍යස්ථානවල වගකීම් හා දේපළ ආරක්ෂාව, මූලස්ථානය සමග සම්බන්ධීකරණය.

මෙම තනතුරු සඳහා අයදුම්කරන්නන් සුදුසු ආකෘතියක් අනුව ඉල්ලුම්පත්‍රයක් පිළියෙළ කොට ඉල්ලුම්පත එවනු ලබන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කර අදාළ සහතිකවල ඡායා පිටපත් සමගින් 2025.01.22 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ **vacancy@youthcorps.lk** යන විද්‍යුත් තැපැල මගින් අයදුම්පත් යොමු කළ යුතු වේ.

අසම්පූර්ණ, අදාළ සුදුසුකම් සපුරා නොමැති හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ,**
**ජාතික යෞවුන් සේනාංක මූලස්ථානය,**
**අංක 420, බෞද්ධාලෝක මාවත,**
**කොළඹ 07.**

**අධ්‍යක්ෂ,**
**ජාතික යෞවුන් සේනාංකය.**
2025.01.09